දූරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) FHB/CNU/05/CHDR/2022

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) 22. 06. 2022

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

**පොදු චක්‍රලේඛ අංක:** 01 - 20 / 2022

සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සෞඛ්‍ය අමාත්‍යංශයේ සියළුම අධ්‍යක්ෂවරුන්,
සියළුම විමධ්‍යගත ඒකක හා විශේෂ වැඩසටහන් ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගර සභාව

**ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන (CHDR) - H 1316 (ගැහැණු) සහ H 1317(පිරිමි)**

ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන (CHDR) උපතේ සිට වයස අවු:19 දක්වා සියලුම ශ්‍රී ලාංකිය දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ විස්තර ඇතුලත් ජාතික මට්ටමේ ප්‍රධානතම ලේඛනය ලෙස සැලකේ. මෙම ලේඛනය හරහා රැස්කෙරෙන සෞඛ්‍ය තොරතුරු සම්භාරය සෑම දරුවෙකුගේම සෞඛ්‍ය කළමණාකරණය සඳහාත් ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා සෑම මට්ටමකදීම සෞඛ්‍ය රැකවරණය පිළිබඳ සැළසුම් සකස් කිරීම සඳහාත් වැදගත් වේ. සෞඛ්‍ය අමාත්‍යංශයේ ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහනේ ළමා සෞඛ්‍ය සේවාවන් සැපයීම සඳහා යොදාගැනෙන මෙම අත්‍යවශ්‍ය සෞඛ්‍ය ලේඛනය H 1316 (ගැහැණු) සහ H 1317 (පිරිමි) යන H (සෞඛ්‍ය) අංක මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ලේඛණයක් ලෙස හඳුනා ගැනේ.

මෙම ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන (H 1316 සහ H 1317) සෞඛ්‍ය අමාත්‍යංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් මුද්‍රණය කර අන්තඃ ජන්ම රැකවරණය සපයන සියලුම රජයේ සහ පෞද්ගලික රෝහල්වලට නිකුත් කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ උපත ලබා එහි වාසය කරන සෑම දරුවකුටම මෙම ලේඛනය උපතේදීම නොමිලේ ලබාදීමට කටයුතු කෙරේ.

සියලුම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා සපයන්නන්, ළදරු ළමා සායන, විශේෂඥ සායන, බාහිර රෝගී අංශ, නේවාසික ප්‍රතිකාර, පාසල් සෞඛ්‍ය පරීක්ෂණ, දන්ත වෛද්‍ය සේවා, පෞද්ගලික සෞඛ්‍ය සේවා ආදී සියලු සේවා සැපයීමේදී මෙම ලේඛනය සෑම දරුවකු සඳහාම භාවිත කළ යුතු බව සහ නිවැරදිව යාවත්කාලීන කළ යුතු බව සැළකිය යුතුය.

ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන (H 1316 සහ H 1317) ශ්‍රී ලංකා රජයේ දේපලක් වන අතර එහි මූලික වගකීම දරන කේන්ද්‍රස්ථානය සෞඛ්‍ය අමාත්‍යංශයේ පවුල් සෞඛ්‍ය කාර්යංශය වේ.

වානිජමය හෝ වානිජමය නොවන අරමුණක් සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් මෙම සටහන අවභාවිත කිරීම, එහි අන්තර්ගතය විකෘති කිරීම හෝ පූර්ව අනුමැතියකින් තොරව සම්පූර්ණ ලේඛනය හෝ ඉන් කොටසක් මුද්‍රණය, ඩිජිටල්කරණය හෝ වෙනත් ආකාරයකින් පිටපත් කිරීම/අනුපිටපත් කිරීම/ ප්‍රතිනිෂ්පාදනය හෝ මේ අනුව සපුරා තහනම් වේ.

මෙම ලේඛනයේ අන්තර්ගතය පිටපත් කිරීමට, ප්‍රතිනිෂ්පාදනයට හෝ ඩිජිටල්කරණයට අවසර පතා කරනු ලබන සියලුම ඉල්ලීම් ලිඛිතව සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල්වරයා වෙනුවෙන් පවුල් සෞඛ්‍ය කාර්යංශයේ මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්‍ෂක වෙත යොමුකළ යුතුය.

මේ අනුව, ශ්‍රී ලංකාවේ සියලුම සෞඛ්‍ය සේවා සපයන්නන් විසින් මෙම ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන්පත (H1316 සහ H 1317) ජාතික ළමා සෞඛ්‍ය සටහන ලෙස සැළකීමටත්, අප රටට සහ දරුවන්ට එහි උපරිම ප්‍රතිලාභය ලබා දීම සඳහා මෙම වැදගත් ලේඛනයේ නිවැරදි භාවිතය තහවුරු කරන ලෙසටත් මෙයින් දන්වා සිටිමි.

මෙම චක්‍රලේඛය සහ එහි අඩංගු කරුණු ඔබේ පළාතේ, දිස්ත්‍රික්කයේ, ආයතනයේ, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශයේ, සහ වෘත්තිකයන්ගේ සංගම්වල සියලුම සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ අවධානයට යොමු කරවන මෙන්ද, සියලු දෙනා මෙම උපදෙස් අනුව කටයුතු කරන බවට වගබලාගත යුතු බවටද කාරුණිකව දැනුම් දෙමි. මෙම චක්‍රලේඛය උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග අනුගමනය කෙරෙනු ඇත.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සභාපති / ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය
සභාපති / ශ්‍රී ලංකා ළමාරෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සංගමය
සභාපති / ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා පරාජන්ම විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍ය සංගමය
සභාපති / ශ්‍රී ලංකා පවුලේ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය
සභාපති / ශ්‍රී ලංකා ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යායතනය
සභාපති / ශ්‍රී ලංකා පෝෂණ සංගමය
සියළුම වෛද්‍ය විද්‍යාල පීඨාධිපතිවරුන්